Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

06 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | 62 S

නම: ............................................ | භූගෝල විද්‍යාව | කාලය පැය දෙකයි

## I කොටස

I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න.**

01) අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේදී භාවිතා වන ක්‍රමවේදයන් ලෙස භාවිතය අවම කිරීම, නැවත භාවිතා කිරීම හා ............................................................. කිරීම 3R ලෙස හැඳින්වේ.
(අලුත්වැඩියා, ප්‍රතිචක්‍රීකරණය, ඇසුරුම්කරණය)

02) මැඩගස්කර් දූපත..................................................... පිහිටා ඇත.
(ඉන්දියන් සාගරයේ, අත්ලන්තික් සාගරයේ, පැසිෆික් සාගරයේ)

03) ශ්‍රී ලංකාවේ ................................................ පළාත දිස්ත්‍රික්ක තුනකින් සමන්විත පළාතකි.
(උතුරු, දකුණු, වයඹ)

04) සුළගේ වේගය මැනීම සඳහා........................................ භාවිතා වේ.
(සුළං දිශා දර්ශකය, අනිලමානය, පීඩන මානය)

05) ශ්‍රී ලංකාවේ රජය මැදිහත් වී නොමිලේ ලබාදෙන සේවාවක් ලෙස .......................................... හැඳින්විය හැක.
(ප්‍රවාහන සේවය, සෞඛ්‍ය සේවය, තැපැල් සේවය)

- **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න.**

06) ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි කුඩාම දිවයිනයි. (............)

07) ඉවතලන අපද්‍රව්‍ය භාවිතා කර කළ හැකි විකල්ප බලශක්ති උත්පාදන ක්‍රමයක් ලෙස ජීව වායු ඒකකය හැඳින්විය හැකිය. (............)

08) ආලෝක විමෝචන ඩයෝඩ භාවිතයෙන් නිර්මාණය කර ඇති විදුලි බල්බය විදුලි පරිභෝජනය අධිකව සිදුවන බල්බ වර්ගයකි. (............)

09) ඉන්ධනයක් ලෙස දර භාවිතය පරිසර දූෂණය අධික ශක්ති ප්‍රභවයකි. (............)

10) වායු දූෂණය නිසා ස්වසන පද්ධතිය ආශ්‍රිතව ඇතිවන රෝගයක් ලෙස පෙනහලු පිළිකා හැඳින්විය හැකිය. (............)

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11) අවිධිමත් භූමි පරිහරණයේ ප්‍රතිඵලයක් නොවන පිළිතුර තෝරන්න.
I. පාංශු ඛාදනය අවමවීම.
ii. පරිසර පද්ධති විනාශ වීම.
iii. නායයෑම් ඇතිවීම.
iv. සත්ත්ව වාසස්ථාන අහිමිවීම.

12) අප භාවිතා කරන සේවාවන් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
i. කෘෂිකර්මය, කර්මාන්ත, සෞඛ්‍ය
ii. අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය
iii. තැපැල්, සන්නිවේදන, ගෘහ කර්මාන්ත
iv. සත්ව පාලනය, අධ්‍යාපනය, ආරක්ෂාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13) ශ්‍රී ලංකාවේ දුම්බර ප්‍රදේශය ප්‍රසිද්ධියක් උසුලන්නේ,
i. වේවැල් භාණ්ඩ සඳහාය. ii. වෙස්මුහුණු කර්මාන්තය සඳහාය.
iii. පිත්තල භාණ්ඩ සඳහාය. iv. පැදුරු සඳහාය.

14) ශ්‍රී ලංකාවේ වැඩිම ප්‍රතිශතයක් ජීවත්වන ආගමික කණ්ඩායම වනුයේ,
i. කතෝලිකය. ii. හින්දුය. iii. ඉස්ලාමිය. iv. බෞද්ධය.

15) මිනිසාට ලෙඩ රෝග බෝකරන සතුන් පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද?
i. නයා, පොළඟා ii. මදුරුවා, මීයා iii. මී මැස්සා, සමනලයා iv.බකමූණා, වවුලාය.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16) දිශාව හඳුනාගැනීම සඳහා භාවිතා වන උපකරණය ...................................... ලෙස හැඳින්වේ.

17) ශ්‍රී ලංකාවේ පිත්තල භාණ්ඩ නිෂ්පාදනයට ................................................. ප්‍රදේශය ප්‍රසිද්ධය.

18) කාලගුණික අංග අතර මූලිකාංගය වන්නේ ........................................... යි.

19) ශීත රටවලින් දැඩි සීතල දරාගැනීමට නොහැකිව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂි විශේෂයක් ලෙස ................................................. හැඳින්වීමට පුළුවන.


20) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වී ඇත්තේ ..................................................... සන්ධියෙනි.

II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01) අ) i. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම දක්වන්න. (ල.04)
ii. ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරය කුමක්ද? (ල.01)
iii. ශ්‍රී ලංකාවේ ස්වභාවික වරාය පිහිටි දිස්ත්‍රික්කය කුමක්ද? (ල.01)
iv. ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් දෙක නම් කරන්න. (ල.02)

ආ) i. පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම දැක්වෙන සිතියම් කොටස ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
i. A අක්ෂරයෙන් දක්වා ඇති මහද්වීපය කුමක්ද? (ල.02)
ii. B අක්ෂරයෙන් දක්වා ඇති බොක්ක කුමක්ද? (ල.02)
iii. C අක්ෂරයෙන් දක්වා ඇති රේඛාව කුමක්ද? (ල.02)
iv. D අක්ෂරයෙන් දක්වා ඇති සාගරය කුමක්ද? (ල.02)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02) i. බීජ ව්‍යාප්තියට සහය වන සතුන් දෙදෙනෙක් නම් කරන්න. (ල.02)

ii. කඳුකර කලාපයේ විශේෂයෙන් වැවෙන එළවළු වර්ග දෙකක් නම් කරන්න. (ල.02)

iii. ශාකයකින් ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.03)


iv. පහත සතුන්ගෙන් අපට ඇති ප්‍රයෝජන එක බැගින් ලියා දක්වන්න. (ල.04)

- ඇටිකුකුළා
- වේයා
- ගැඩවිලා
- බත්කූරා

03) i. ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටි ස්ථානය ලියන්න. (ල.01)

ii. පසුගිය කාලයේ ඔබ අත්දුටු කාලගුණික තත්ත්වයන් දෙකක් දක්වන්න. (ල.02)

iii. වර්ෂාව ඇතිවන ආකාරය දැක්වෙන පහත රූපසටහනේ A,B,C,D අක්ෂර වලින් දක්වා ඇති අවස්ථාවන් පිළිවෙලින් නම් කරන්න. (ල.04)





iv. පහත කාලගුණික අංග මනින උපකරණ සහ ඒකක දැක්වෙන වගුවක් සකස් කරන්න.

- උෂ්ණත්වය
- සුළඟේ දිශාව
- පීඩනය
- ආර්ද්‍රතාවය

(ල.04)

04) i. පහත A හා B රූප සටහන් වලින් දැක්වෙන නිවාස පිහිටා ඇති පරිසර වර්ග දෙක පිළිවෙලින් දක්වන්න. (ල.02)

A



B



ii. බෑවුම් සහිත පරිසරයක පාංශු ආරක්ෂා කරගැනීම සඳහා අනුගමනය කළ හැකි කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ල.02)

iii. වෙරළාශ්‍රිත බිම් වලින් ඇති ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ල.03)

iv. උස්බිමක ජීවත්වීමේ ඇති වාසි දෙකක් හා අවාසි දෙකක් වෙන වෙනම ලියන්න. (ල.04)

05) i. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග තුනක් සඳහන් කරන්න. (ල.03)
ii. රටක විවිධ ජාතීන් ජීවත්වීමෙන් ඇතිවන වාසි දෙකක් ලියන්න. (ල.02)
iii. පහත A,B,C වලින් දැක්වෙන ආගමික සංකේත අයත් ආගම් පිළිවෙලින් ලියා දක්වන්න. (ල.03)




A B C

iv. පහත සඳහන් උත්සව අවස්ථාවන් අයත්වන ආගම් මොනවාදැයි ලියන්න. (ල.03)
A - නත්තල් B - තෛපොංගල් C - රාමසාන්

06) i. ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත දෙකක් ලියන්න. (ල.02)
ii. ගෘහ ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන කුඩා පරිමාණ කර්මාන්ත දෙකක් සඳහන් කරන්න. (ල.02)
iii. රටක කර්මාන්ත ව්‍යාප්ත වීමෙන් අත්වන වාසි තුනක් දක්වන්න. (ල.03)
iv. පහත සේවාවන්ගෙන් ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න. (ල.04)

- තැපැල්
- ප්‍රවාහන
- සෞඛ්‍ය
- බැංකු

07) පහත ප්‍රහේලිකාව පුරවන්න.




හරහට

01) පුෂ්ප පරාගනයට උදව් කරන කෘමියෙකි.
05) වේවැල් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයකි.
07) මෙම තත්ත්වය නිසා ජල හිඟය ඇතිවේ.
09) දිශාව සොයා ගැනීම සඳහා උපකාරි වන උපකරණයකි.
11) කාලගුණික අංගයකි.

පහළට

02) ශ්‍රී ලංකාවඉන්දියන් ................................. තුළ පිහිටා ඇත.
03) දෙමළ ජනයාගේ ප්‍රධාන ආගම
04) සුළගේ වේගය මැනීම සඳහා භාවිතා කරන උපකරණය
06) උතුරු පළාතේ වෙරළක් අහිමි දිස්ත්‍රික්කය
08) කඳුකර ප්‍රදේශයේ හොඳින් වැවෙන බෝග වර්ගයකි.
10) උතුර සහ බස්නාහිර දිශා අතර පිහිටි අනු දිශාව.

* * * * * *

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



1 කොටස - පිළිතුරු

01) ප්‍රතිචක්‍රීකරණය 02) ඉන්දියන් සාගරයේ 03) දකුණු 04) අනිලමානය 05) සෞඛ්‍ය සේවය
06) × 07) ✓ 08) × 09) ✓ 10) ✓ 11) 1 12) 2 13) 4 14) 4 15) 2 16) මාලිමාව
17) පිළිමතලාව 18) උෂ්ණත්වය 19) සුදු රෙදි හොරා/ සිවුරු හොරා/ අච්චිචියා 20) පෝක් සමුද්‍ර සන්ධියෙන්

11 කොටස - පිළිතුරු

01) අ) i. අසියා මහද්වීපයට දකුණින් ද , ඉන්දියන් සාගරයට උතුරින් ද, ගිණිකොණ ආසියාවට බටහිරින් ද අප්‍රිකා මහද්වීපයට නැගෙන හිරින්ද ශ්‍රී ලංකාව පිහිටා ඇත
ii. ශ්‍රී ජවයර්ධනපුර කෝට්ටෙ iii. ත්‍රිකුණාමලය iv. කටුනායක ගුවන් තොටුපල, මත්තල ගුවන් තොටුප
ආ) i. ආසියා මහද්වීපය ii. බෙන්ගාල බොක්ක iii. සමකය iv. ඉන්දියන්

02) i. වව්ලා, ලේනා, ගිරවා ආදී බීජ ව්‍යාප්තියට දායක වන ඕනෑම සතෙක් ii. කැරට්, ලීක්ස්, ගෝවා, රතු අල වැනි කදුකර කලාපයට ආවේනික ඵළවලු වර්ග දෙකක් තිබීම අවශ්‍ය වේ. iii. ඖෂධ සඳහා, ආහාර සඳහා, ආදී ඕනෑම නිවැරදි ප්‍රයෝජනයක් iv. ඇටි කුකුලා - ගොළුබෙල්ලන් වැනි වගාවන්ට හානිකරන සතුන් කා දැමීම.
වේයා - කොල රොඩු දිරා පත්වීමට සහාය වීම ගැඩවිලා - පස පෝෂණය කිරීම බත්කූරා - ශාඛ වලට හානි කරන කෘමීන් කා දැමීම

03) i. කොළඹ 07 බෞද්ධාලෝක මාවත ii. වැසිබර කාලගුණය, සුළං සහිත කාලගුණය , උණුසුම් කාලගුණය ආදී කාලගුණ තත්ත්වයන් iii. A – වාෂ්පීකරණය B – උත්ස්වේදනය C – ඝණීභවනය D - වර්ෂාව
iv.

| කාලගුණික අංගය | මනින උපකරණය | මනින ඒකකය |
|---|---|---|
| උෂ්ණත්වය | උෂ්ණත්වමානය | සෙල්සියස් අංශක( $C^0$ ) ෆැරන්හයිට් අංශක ( $F^0$ ) |
| වර්ෂාපතනය | වර්ෂාමානය | මිලි මීටර්(mm) |
| පීඩනය | පීඩනමානය/බැරෝමීටරය | මිලිබාර් (mb) |
| ආර්ද්‍රතාවය | ආර්ද්‍රතාමානය (හයිග්‍රෝමීටර්) | % |

04) i. ග්‍රාමීය පරිසරය නාගරික පරිසරය ii. ගල්වැටි දැමීම, තණ පිඩැලි ඇල්ලීම, තෘණ වැවීම, කාණු කැපීම ආදී...
iii. ධීවර කර්මාන්තය, කරවල වේලීම, පොල් වැනි වගාවන් සිදු කිරීම, සංචාරක කර්මාන්තය ආදී ..........
iv.

| උස් බිමක ජීවත්වීමේ වාසි | උස් බිමක ජීවත්වීමේ අවාසි |
|---|---|
| ජල ගැලීම් වැනි ආපදා අඩු වීම. | නායයෑම් වැනි උපද්‍රා වලට ලක්වීම |
| අවට පරිසරය හොඳින් පෙනීම | ප්‍රවාහන අපහසුතා ඇතිවීම ආදී නිවැදි කරුණු |

05) i. සිංහල,දෙමළ, මුස්ලිම් (යෝනක) බර්ගර්, මැලේ ආදී ඕනෑම ජන වර්ග තුනක්
ii. විවිධ සංස්කෘතීන් හඳුනා ගැනීමට හැකිවීම, විවිධ භාෂාවන් කතා කිරීමට පුරුදු වීම, ආදී නිවැරදි කරුණු
iii. බෞද්ධ, ඉස්ලාම්, කතෝලික/ක්‍රිස්තියානි iv. A - ක්‍රිස්තියානි B - හින්දු C - මුස්ලිම්

06) i. පිත්තල භාණ්ඩ නිෂ්පාදනය, වේවැල් භාණ්ඩ නිපදවීම, වළං කර්මාන්තය, බීරලු කර්මාන්තය ආදී ......
ii. අත් යන්ත්‍ර රෙදි වියීම, පොල් ලෙලි කැපීම, වඩු කර්මාන්තය ආදී ......
iii. රැකියා අවස්ථාවන් බිහිවීම, ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය, සම්පත් වලින් ප්‍රයෝජන ගතහැකිවීම ආදී ........
iv. තැපැල් - තොරතුරු හා භාණ්ඩ හුවමාරු කිරීමේ හැකියාව
ප්‍රවාහන - පහසුවෙන් ගමන් බිමන් හා රැකියාවන්ට යා හැකිවීම
සෞඛ්‍ය - පහසුවෙන් බෙහෙත් හා උපස්ථාන කටයුතු ලබා ගැනීමට හැකිවීම
බැංකු - මුදල් ගනුදෙනු පහසුවෙන් කරගතහැකිවීම ආදී ........

07) හරහට
1. මීමැස්නා 5. රදාවඩුන්න 7. නියඟය 9. මාලිමාව 11 වර්ෂාව
පහළට
2 සාගරය 3 හින්දු 4 අනිලමානය 6. වව්නියාව 8 . එළවලු 10 වයඹ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



1 කොටස - පිළිතුරු

01) ප්‍රතිචක්‍රීකරණය 02) ඉන්දියන් සාගරයේ 03) දකුණු 04) අනිලමානය 05) සෞඛ්‍ය සේවය
06) × 07) ✓ 08) × 09) ✓ 10) ✓ 11) 1 12) 2 13) 4 14) 4 15) 2 16) මාලිමාව
17) පිළිමතලාව 18) උෂ්ණත්වය 19) සුදු රෙදි හොරා/ සිවුරු හොරා/ අච්චිච්යා 20) පෝක් සමුද්‍ර සන්ධියෙන්

11 කොටස - පිළිතුරු

01) අ) i. අසියා මහද්වීපයට දකුණින් ද , ඉන්දියන් සාගරයට උතුරින් ද, ගිණිකොණ ආසියාවට බටහිරින් ද අප්‍රිකා මහද්වීපයට නැගෙන හිරින්ද ශ්‍රී ලංකාව පිහිටා ඇත

ii. ශ්‍රී ජවයර්ධනපුර කෝට්ටෙ iii. ත්‍රිකුණාමලය iv. කටුනායක ගුවන් තොටුපල, මත්තල ගුවන් තොටුප

ආ) i. ආසියා මහද්වීපය ii. බෙන්ගාල බොක්ක iii. සමකය iv. ඉන්දියන්

02) i. වච්ලා, ලේනා, ගිරවා ආදී බීජ ව්‍යාප්තියට දායක වන ඕනෑම සතෙක් ii. කැරට්, ලීක්ස්, ගෝවා, රතු අල වැනි කදුකර කලාපයට ආවේනික ඔළවලු වර්ග දෙකක් තිබීම අවශ්‍ය වේ. iii. ඖෂධ සඳහා, ආහාර සඳහා, ආදී ඕනෑම නිවැරදි ප්‍රයෝජනයක් iv. ඇටි කුකුලා - ගොළුබෙල්ලන් වැනි වගාවන්ට හානිකරන සතුන් කා දැමීම.
වේයා - කොල රොඩු දිරා පත්වීමට සහාය වීම ගැඩවිලා - පස පෝෂණය කිරීම බත්කූරා - ශාඛ වලට හානි කරන කෘමීන් කා දැමීම

03) i. කොළඹ 07 බෞද්ධාලෝක මාවත ii. වැසිබර කාලගුණය, සුළං සහිත කාලගුණය , උණුසුම් කාලගුණය ආදී කාලගුණ තත්ත්වයන් iii. A – වාෂ්පීකරණය B – උත්ස්වේදනය C – ඝණීභවනය D - වර්ෂාව

iv.

| කාලගුණික අංගය | මනින උපකරණය | මනින ඒකකය |
|---|---|---|
| උෂ්ණත්වය | උෂ්ණත්වමානය | සෙල්සියස් අංශක( $c^0$ ) ෆැරන්හයිට් අංශක ( $F^0$ ) |
| වර්ෂාපතනය | වර්ෂාමානය | මිලි මීටර්(mm) |
| පීඩනය | පීඩනමානය/බැරෝමීටරය | මිලිබාර් (mb) |
| ආර්ද්‍රතාවය | ආර්ද්‍රතාමානය (හයිග්‍රෝමීටර්) | % |

04) i. ග්‍රාමීය පරිසරය නාගරික පරිසරය ii. ගල්වැටි දැමීම, තණ පිඩැලි ඇල්ලීම, තෘණ වැවීම, කාණු කැපීම ආදී...
iii. ධීවර කර්මාන්තය, කරවල වේලීම, පොල් වැනි වගාවන් සිදු කිරීම, සංචාරක කර්මාන්තය ආදී ..........

iv.

| උස් බිමක ජීවත්වීමේ වාසි | උස් බිමක ජීවත්වීමේ අවාසි |
|---|---|
| ජල ගැලීම් වැනි ආපදා අඩු වීම. | නායයෑම් වැනි උපද්‍රා වලට ලක්වීම |
| අවට පරිසරය හොඳින් පෙනීම | ප්‍රවාහන අපහසුතා ඇතිවීම ආදී නිවැදි කරුණු |

05) i. සිංහල,දෙමළ, මුස්ලිම් (යෝනක) බර්ගර්, මැලේ ආදී ඕනෑම ජන වර්ග තුනක්
ii. විවිධ සංස්කෘතීන් හදුනා ගැනීමට හැකිවීම, විවිධ භාෂාවන් කතා කිරීමට පුරුදු වීම, ආදී නිවැරදි කරුණු
iii. බෞද්ධ, ඉස්ලාම්, කතෝලික/ක්‍රිස්තියානි iv. A - ක්‍රිස්තියානි B - හින්දු C - මුස්ලිම්

06) i. පිත්තල භාණ්ඩ නිෂ්පාදනය, වේවැල් භාණ්ඩ නිපදවීම, වළං කර්මාන්තය, බීරලු කර්මාන්තය ආදී ......
ii. අත් යන්ත්‍ර රෙදි විවීම, පොල් ලෙලි කැපීම, වඩු කර්මාන්තය ආදී ......
iii. රැකියා අවස්ථාවන් බිහිවීම, ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය, සම්පත් වලින් ප්‍රයෝජන ගතහැකිවීම ආදී ........
iv. තැපැල් - තොරතුරු හා භාණ්ඩ හුවමාරු කිරීමේ හැකියාව
ප්‍රවාහන - පහසුවෙන් ගමන් බිමන් හා රැකියාවන්ට යා හැකිවීම
සෞඛ්‍ය - පහසුවෙන් බෙහෙත් හා උපස්ථාන කටයුතු ලබා ගැනීමට හැකිවීම
බැංකු - මුදල් ගනුදෙනු පහසුවෙන් කරගතහැකිවීම ආදී ........

07) හරහට
1. මීමැස්නා 5. රදාවඩුන්න 7. නියඟය 9. මාලිමාව 11 වර්ෂාව
පහළට
2 සාගරය 3 හින්දු 4 අනිලමානය 6. වච්නියාව 8 . එළවලු 10. වයඹ